සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කළාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,242 - 2021 අගෝස්තු මස 20 වැනි සිකුරාදා - 2021.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1220 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1238 |


සැ. යු.- (i) ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ජූලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙකී පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම්වලින් අදාළ බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්. කේ. ආනන්ද වීරසිංහ,
සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

මාර්ග ලියාපදිංචි කිරීම

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | *මීටර්* | *අඩි* |
| 01 ඇට කෙහෙල්හේන පාර | 323E ඊරියතොට | 01. ඩී. කේ. සමීර සංජීව මහතාගේ ඉඩම<br>02. ඩී. කේ. රත්නපාල මහතාගේ ඉඩම | 01. ඩී. කේ. කමලාවතී මියගේ ඉඩම<br>02. ඩී. එච්. රංජිත් දයානන්ද මහතාගේ නිවස<br>03. ජී. දර්ශන රුමේෂ් මහතාගේ නිවස | සේපාල ස්ටෝර්ස් අසලින් | ඇට කෙහෙල්හේන | 70 | 10 |
| 02. බණ්ඩාරවත්ත පාර | කරගොඩ උයන්ගොඩ 11 අත බටහිර - 316 A | හෙට්ටිගේ ඕවිට ඉඩම | 01. කරාදි කන්ද ඉඩම<br>02. නයින්දම්මා ඕවිට ඉඩම | බණ්ඩාර වත්ත (කරගොඩ උයන්ගොඩ 11 අත බටහිර) | බණ්ඩර වත්ත (කරගොඩ උයන්ගොඩ 11 අත බටහිර) | 200 | මීටර් 3.5 |
| 03. තුඹේ මාහේන හන්දියේ සිට කෝංගහ හේන දක්වා මාර්ගය | තුඹේ 321 D | 01. මාහේන ඉඩම<br>02. කෝංගහ හේන ඉඩම | 01. මාහේන ඉඩම<br>02. කෝංගහ හේන ඉඩම | මාහේන ඉඩම | කෝංගහ හේන ඉඩම | 50 | 10 |

08-280

## පානදුර නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි වේ.

මහ නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය, නගර සභා ආඥාපනතේ 55 (ආ) වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව, ගරු ආණ්ඩුකාර තුමා විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් (පොදු ස්ථාන) අළුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇම්. ඩී. නන්දන ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

**සභාවට අයත් ආයතන නම් කිරීම**

| *අනු. අංකය* | *ආයතනයේ වර්තමාන නම* | *අළුතින් යොදා ඇති නම* | *පිහිටීම* |
|---|---|---|---|
| 1 | සොලමන් මාවත පෙර පාසල | වැකඩ පෙර පාසල | පානදුර නගර සභාවට අයත්, වැකඩ උතුර කොට්ඨාසයේ එකම භූමියක පිහිටා ඇති ආයතන 4 කි. |
| 2 | ෆොන්සේකා පාර කියවීම් ශාලාව | වැකඩ කියවීම් ශාලාව | එම |
| 3 | වලපල මාතෘ සායනය | වැකඩ මාතෘ සායනය | එම |
| 4 | සොලන් මාවත ක්‍රීඩා පිටිය | වැකඩ ක්‍රීඩා පිටිය | එම |

08-240

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළ යුතු මාර්ග**

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | අංක 42 උඩඅළුදෙණිය | පළමුවන පටුමග ගම්මල්ලාගොඩ | ලක්මිණි ප්‍රේමතිලක මහත්මියගේ නිවස අසලින් ගම්මල්ලාගොඩ මුරුතගහමුල මාර්ගය | ටී. පී. ජී. සීතා මහත්මියගේ නිවස අසලින් | එච්. එම්. ගුණරත්න බණ්ඩා මයා<br>එච්. එම්. ශාන්ති මිය | ටී.පී.ජී. සීතා මිය<br>එච්. එම්. ජයතිලක බණ්ඩා<br>එච්. ටී. සී. ටී. විමලරත්න මයා | 135 | 06 |
| 02. | අංක 41 වැලිගල්ල | අඹකොටේවත්ත I වෙනි පටුමග | තලවතුර ප්‍රධාන මාර්ගයේ සිට | එම්. ඩබ්. සංජය හීන්නිලමේ යන අයගේ ඉඩම | ලක්ෂිකා කුමාරි ගල්කොටුව මිය<br>එස්. යූ. ඩී. සමරසිංහ මිය<br>ආර්. එම්. නන්දාවතී මිය<br>එම්. එච්. ඩබ්. එස්. හීන්නිලමේ මයා<br>කේ. සරත් කුමාර මයා | - | 225 | 10 |

08-281

---

**උඩපළාත ප්‍රාදේශීය සභාව - ප්‍රජා මණ්ඩල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

නිවේදනය

**උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්යය හා කර්තව්‍ය තීරණය කිරීම හා නියාමනය කිරීම පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථාව**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 03 වන වගන්තියේ (1) වන උපවගන්තයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) උපවගන්තිය ප්‍රකාරව 2020.06.16 වන දින අංක 05-16 යටතේ ගන්නා ලද තීරණය අනුව පහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
උඩපළාත ප්‍රාදේශීය සභාව,
දූල්පිටිය,
අටබාගේ.

2021 ජූලි මස 22 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (අනුපාතික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ 01 වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2018.09.25 වැනි දින අංක 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම ඒවායේ කාර්යය හා කර්තව්‍ය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2020.06.16 වැනි දින පැවති මහ සභාවේ 5-16 යටතේ මෙයින් තීරණය කරමි.

08-244

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

වර්ෂ 2021 ක් වූ අප්‍රේල් මස 09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2,223 දරන පළාත් පාලන නිවේදන යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද දැන්වීම් ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන 1 සිට 11 දක්වා සඳහන් කොට ඇති මාර්ග සඳහා කිසිදු විරෝධතාවයක් ලැබී නොමැති බැවින් එම මාර්ග සභාව සතු මාර්ග ලෙස සලකා පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

චන්දන කුමාර ජයවන්දල,
සභාපති,
ප්‍රාදේශීය සභාව මාවනැල්ල.

2021 ජූලි මස 12 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* |
|---|---|---|
| 1 | මාවතලන්ද වත්ත අතුරු මාර්ගය | හබ්බුන්කඩුව |
| 2 | සාමා පටුමග | මහවත්ත |
| 3 | කැලුන්දෙණිය පාර | අඹරුප්ප |
| 4 | පන්සල් පටුමග | හබ්බුන්කඩුව |
| 5 | මැද්දේගොඩ වත්ත පාර | ගිනිහප්පිටිය |
| 6 | වරකාගොඩවත්ත පාර | වේරකේ |
| 7 | ජයසිරිවත්ත දෙවන පටුමග | කප්පාගොඩ |
| 8 | නාවුල්ල පාර | පල්ලිපෝරුව |
| 9 | හීන්දෙණිය පාරේ සිට කුසුමාවතී රත්නායක යන අයගේ නිවස දක්වා දිවෙන මාර්ගය | ගෝන්දිවෙල |
| 10 | රහුමානියා මාවත පළමු පටුමග | මහවත්ත |
| 11 | වැලිදෙණිය කුඹුර දක්වා මාර්ගය | දාස්වත්ත |

08-291

---

## මාවතගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති මංමාවත මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශ කර *ගැසට් පත්‍රයේ* පළ කිරීම සුදුසු බවට 2021.04.08 වන දින පැවති මහ සභාවේ දී තීරණය විය. ඒ අනුව මෙහි සඳහන් කර ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත් සම්බන්ධයේ අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට අඩි 25 බල පැවැත්වේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

2021 අගෝස්තු මස 03 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.


**ග්‍රාම නිලධාරි වසම - 654 කහපත්වල**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | කැබිලිතිගොඩ පන්සල් මාර්ගය |
| මාර්ගයේ දිග | - | මීටර් 220.3 (අඩි 723) |
| මාර්ගයේ පළල | - | මීටර් 3.5 (අඩි 10) |
| මාර්ගයේ ආරම්භය | - | හතරලියද්ද ප්‍රධාන මාර්ගය |
| මාර්ගයේ අවසානය | - | විහාර මළුව |

| *වම්පස ඉඩම් හිමියන්* | *දකුණුපස ඉඩම් හිමියන්* |
|---|---|
| කැබිලිතිගොඩ විහාරයට අයත් වත්ත | කැබිලිතිගොඩ විහාරයට අයත් වත්ත |

ඊ.එම්.විජේබණ්ඩාර,
ලි.ප.බලයලත් මිනින්දෝරු
ලි.ප.අංක :- 19911053
9 කනුව, නුවර පාර, වැළඩ.
දුරකථනය:- 037- 2299575
071-4431927

පිඹුරු අංකය :-1620




පරිමාණය 1: 1000

යොමුව

ඉ ඉවුර
බැ වලාකුළු බැම්
අවි අවිනිශ්චිත මායිම
බෝ බෝක්කුව
ගේ ගේට්ටුව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ

වැළඩ විල්ලි හත්පත්තුවේ ගන්නවයේ කෝරළේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 654- කහපත්වල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ කහපත්වල ගමෙහි පිහිටි " කැබිමිතිගොඩ - - ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මළුව දක්වා මහා මාර්ගයේ සිට දැනට පිහිටි මාර්ගය මැන සාදන ලද

පිඹුර

| මාර්ගයේ නම | මායිම් විස්තරය | මාර්ගයේ දිග | මාර්ගයේ පළල (අවම) |
|---|---|---|---|
| ඉළුක්වෙල-හතරලියද්ද මහා මාර්ගයේ සිට කහපත්වල කැබිමිතිගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මළුව දක්වා පිහිටි මාර්ගය (භූමි ප්‍රමාණය:-හෙක්ටෙයර 0.0675) (අ.0 රූ.0 පර.26.7) | ඉළුක්වෙල-හතරලියද්ද මහා මාර්ගයේ වම් පසින් ආරම්භව කහපත්වල කැබිමිතිගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයේ විහාර මළුව දක්වා වූ මාර්ගයේ වම් පසින් හා දකුණු පසින් කහපත්වල කැබිමිතිගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයට අයත් කැබිමිතිගොඩවත්ත. | මීටර 220.3 (අඩි 723 ) | මීටර 3.05 (අඩි 10 ) |

මැනීම ඉල්ලුම්කල අය
මායිම් පෙන්වාදෙන ලද අය } පූජ්‍ය සියඹලන්ගමුවේ සුමනතිස්ස හිමි.

මැනීම කල දිනය:- 2021-03-02

දිනය:- 2021-03-04

ලි.ප.බලයලත් මිනින්දෝරු
ජී. එම්. [illegible]
ලි.ප. බලයලත් මිනින්දෝරු
දු.අ. 071-4431927/037-2299575

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මාවත පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් මෙම මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළකරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

සභාපති,
අනුර ප්‍රනාන්දු,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.

2021 ජූලි මස 26 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | මාර්ගයේ නම | - | පල්ලිය මාවත |
| 02. | ආරම්භය | - | ගල්හින්න ඉස්මයිල් පල්ලිය |
| 03. | අවසානය | - | ඒ. එච්. එම්. නවාස්ගේ මහතාගේ ඉඩම |
| 04. | ග්‍රාම නිලධාරි වසම | - | ගල්හින්න අංක 524 |
| 05. | පිඹුරු අංකය | - | 13168 |


**උපලේඛනය**

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. එම්. එච්. එම්. නදීර් මයාට අයත් ඉඩම | 01. එම්. එච්. එම්. නදීර් මයාට අයත් ඉඩම | මීටර් 385 | අඩි 8 |
| 02. එම්. ජේ. නවුෆර් මයාට අයත් ඉඩම | 02. එම්. ඉසඩ්. එම්. ෂාරුක් මයාට අයත් ඉඩම | | |
| 03. කමල්දීන් රිසානා මියට අයත් ඉඩම | 03 ඒ. එච්. එම්. නවාස් මයාට අයත් ඉඩම | | |
| 04. ඒ. එච්. එම්. නවාස් මයාට අයත් ඉඩම | | | |

PRIYANTHA PUNCHIHEWA
Licensed Surveyor & Leveller,
10-C, Main Street,
Pujapitiya
T.Phone : 0812300702

# PLAN NO:13168

Reference
st – stake
W – Wall
cp – concrete post
Ep – Electric post
Tp – Telephone post
P – Permanent building
Road(PC) – Road(Provincial Council)
Road(PS) – Road(Pradesiya Sabha)
FP – Foot Path




SCALE 1:500

## PLAN

OF

*Portion of land called*

*Mukalanyayawatta*

SITUATED AT

*Galhinna in Pallegampaha of Harispattu*

*( .hinna G.N.Division No 524 of Pujapitiya–*
*–Secretarial Division & Pradesiya Sabha)*

**KANDY DISTRICT**

**CENTRAL PROVINCE**

**Containing in Extent :**

| Lot No | Hectare | $m^2$ | A | R | P | Allotted to |
|---|---|---|---|---|---|---|
| 1 | 0.0285 | — | 0 | 0 | 11.25 | Pujapitiya Pradesiya Sabha(min.10Ft.wide Road) |

..veyed on :26-05-2019

F.B.No:283/9-10

Licensed Surveyor & Leveller,


| | | | |
|---|---|---|---|
| 01. | මාර්ගයේ නම | - | සමගි මාවත |
| 02. | ආරම්භය | - | රාජකරුණා මාවත |
| 03. | අවසානය | - | ඩී. ජී. එන්. සමරවීරට අයත් ඉඩම |
| 04. | ග්‍රාම නිලධාරි වසම | - | මාරතුගොඩ උතුර අංක 508 |
| 05. | පිඹුරු අංකය | - | 14060 |

**උපලේඛන**

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. කේ. යූ. මහින්ද මයාට අයත් ඉඩම | 01. ඩී. ජී. ඥාණදස මයාට අයත් ඉඩම | මීටර් 120 | අඩි 8 |
| 02. ආර්. යූ. සිරියාවතී මියට අයත් ඉඩම | 02. කේ. යූ. සී. එල්. කේ. රාජකරුණා මයාට අයත් ඉඩම | | |
| 03. ඩී. ජී. හීන් අම්මා මියට අයත් ඉඩම | 03. ඩී. ජී කේ. ප්‍රේමතිලක මයාට අයත් ඉඩම | | |
| 04. කේ. යූ. සී. එල්. කේ. රාජකරුණා මයාට අයත් ඉඩම | 04. ඩී. ජී. එන්. සමරවීර මයාට අයත් ඉඩම | | |

**PRIYANTHA PUNCHIHEWA**
Licensed Surveyor & Leveller,
10–C, Main Street,
Pujapitiya
T.Phone : 081–2300702

## PLAN NO:14060




***Reference***

*cp – concrete post*
*Road(PC) – Road(Provincial Council)*
*Edr – Earth drain*
*G – Gate*

SCALE 1:500

**PLAN**
**OF**
**PORTION OF LAND CALLED**
*Mota–ambagashinnewatta*
*alias Karawgashinnewatta*
*(Samagi Mawatha)*
**SITUATED AT**
*Maratugoda in Galasiyapattu of Harispattu*
*(Maratugoda North G.N.Division No 508 of Pujapitiya –*
*-Secretarial Division & Pradesiya Sabha)*

**KANDY DISTRICT**

**CENTRAL PROVINCE**

**Containing in Extent :**

| Lot No | Hectare | $m^2$ | A | R | P |
|---|---|---|---|---|---|
| 1 | 0.0394 | 394 | 0 | 0 | 15.60 |

**Allotted to**
Pujapitiya Pradesiya Sabha
(min.10ft.wide Road)

Surveyed on: 16–03–2021

F.B.276/58–59

PRIYANTHA PUNCHIHEWA
Licensed Surveyor & Leveller,
10-C, Main Street,
PUJAPITIYA.
T. P. 08-300702

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/1/22-2 හා 2021/05/13 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

බුළුරුප්ප,
හෙට්ටිමුල්ල.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| පාරේ නම | - | තලේවෙල කණුහැත්තෑව පාරේ පාළම අසල අතුපාර (තලේවෙල එගොඩ පාර) |
| වසම | - | තලේවෙල |
| මාර්ගයේ දිග | - | මීටර් 183.3 |
| මාර්ගයේ පළල | - | AB-3m, BC-3.6m, CD-3.5m, DE-3.6m, EF-3.3m, FG-4.2m, GH-3.7m, HI-3.2m, JK-3.5m, KL-3m, LM-3m |

*මාර්ගයේ දකුණුපස*


1. වී. ගුණතිලක යන අයට අයත් ඉඩම
2. එම්. ඩබ්. නන්ද ආරියවංශ යන අයට අයත් ඉඩම
3. වී. රංජිත් බණ්ඩාර යන අයට අයත් ඉඩම
4. හරිස්චන්ද්‍ර යන අයට අයත් ඉඩම
5. රණතුංග යන අයට අයත් ඉඩම

*මාර්ගයේ වම්පස*

1. ඇළ
2. එම්. ඩබ්. නන්ද ආරියවංශ යන අයට අයත් ඉඩම
3. වී.රංජිත් බණ්ඩාර යන අයට අයත් ඉඩම
4. ස්වර්ණා කුමාරි යන අයට අයත් ඉඩම
5. නාලක අබේරත්න යන අයට අයත් ඉඩම

**බී.ආර්.එම්. කුමාරි බස්නායක (ලි.ප. අංකය 19911223)**
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ,
උසාවි කොමසාරිස්,
"පසන් වරුණ"
ඇකිරියගල පාර, පරගම්මන,
කෑගල්ල.

# පිඹුරු අංකය 1251




| | මධ්‍යක පළල | | දිග | |
|---|---|---|---|---|
| | මීටර් | අඩි | මීටර් | අඩි |
| AB | 3 | 9.75 | 38.7 | 126 |
| BC | 3.6 | 11.7 | 13.0 | 042 |
| CD | 3.5 | 11.3 | 11.6 | 038 |
| DE | 3.6 | 11.7 | 07.6 | 024 |
| EF | 3.3 | 10.7 | 17.7 | 057 |
| FG | 4.2 | 13.6 | 11.3 | 036 |
| GH | 3.7 | 12.0 | 08.0 | 026 |
| HI | 3.2 | 10.4 | 22.7 | 073 |
| JK | 3.5 | 11.3 | 16.5 | 053 |
| KL | 3 | 9.7 | 20.5 | 066 |
| LM | 3 | 9.7 | 15.7 | 051 |
| එකතුව | | | 183.3 | 592 |

**පරිමාණය : 1 : 1000**

## සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ

### පරණකූරු කෝරළයේ මාවත පත්තුවේ

### කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ

**තලේවෙල ගමේ පිහිටි " තලේවෙල - කණුහැත්තෑව පාරේ පාලම අසල අතුපාර "නමැති ඉඩම**

මා විසින් භූමියේ පවතින මායිම් අනුව මැන සාදන ලද

# පිඹුර

| කැබලි අංකය | අ. | රූ. | ප. | වර්ගමීටර් |
|---|---|---|---|---|
| 1 | 0 | 0 | 24.00 | 607 |

සත්‍ය පිටපතකි
.............................
සංජීවා ක්‍රිශාන්ති,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

මායිම් - ඉහත සඳහන් පරිදි.

මා විසින් මැන බෙදීම කළේ 2021. 02. 28 දින දීය.

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
2021. 03. 02

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | - | දෙවෙල්දෙනිය දික්කැල්ල මාර්ගය |
| 02. | වසම | - | 12 කළුගල්ල |
| 03. | මාර්ගයේ දිග | - | මීටර් 183.75 |
| 04. | මාර්ගයේ පළල | - | මීටර් 3.00 |

*මාර්ගයේ දකුණු පස*

1. පී. එස්. ඒ. පිටවල යන අයට අයත් ඉඩම
2. ජී. ධර්මසේකර යන අයට අයත් ඉඩම
3. වී. රංජිත් බණ්ඩාර යන අයට අයත් ඉඩම

*මාර්ගයේ වම්පස*

1. ඒ. ජී. ජයසිංහ යන අයට අයත් ඉඩම
2. ඩී. තුසිත සම්පත් යන අයට අයත් ඉඩම
3. එස්. එච්. තිලකාවතී සෝමවීර යන අයට අයත් ඉඩම


**P.G.R.A.DINANJAYA GAMLATH**
BSc(Surveying Sciences),
Registered Government Surveyor,
Registered Licensed surveyor & Leveller
Regd.No: 20081742
No.41,Rockhill, Kegalle.
Kegalle.
071-9890870, 075-9890870
e-mail-gamlathgl@gmail.com

**PLAN NO : 0223**

Referance No.2014.07.KEG.0223
Field Book No.2014/03

Reference

| | |
|---|---|
| ST | Stake |
| CP | Cement Post |




සහතික පිටපතකි

සංවේදා නිශාන්ති,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

**SCALE 1:1000**

**PLAN**

**OF**

An allotment of Land marked Lot 1 being resurvey of the existing boundaries of defined Lot 10 of a land called DEWELDENIYAWATTA alias DICKELLAWATTA, depicted in my Plan No.KGL/182A, dated 3rd July 2014 situated at Waldeniya village No.51, Waldeniya G.N.Division within Divisional Secretarial and Pradeshiya Saba Limit of Kegalle in Mawatha Pattu of Paranakuru Korale within

**KEGALLE DISTRICT**

**SABARAGAMUWA PROVINCE**

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.0077 | 0 | 0 | 03.06 |

| Length of Road | Width of Road |
|---|---|
| 30.90 m | 2.5m |

1. Scale applies to original only.
2. Outer boundaries surveyed as pointed out by owner of the land.
3. Boundries shown in red have being superimposed from Plan No.PP A 1222,authenticated by Surveyor General

Surveyed on
Date: 13th December 2020

Use for Local Authority

P. G. R. A. Dinanjaya Gamlath
Registered Licensed Surveyor & Leveller
L.S.C. Rego. No. 20081742
No.41, Rockhill, Kegalle
071 - 9890870, 075 - 9890870
e-mail-gamlathgl@yahoo.com

15th December 2020

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | - | කහටකුඹුර කෘෂි මාර්ගය |
| 02. | වසම | - | 12 කළුගල්ල |
| 03. | මාර්ගයේ දිග | - | මීටර් 183.75 |
| 04. | මාර්ගයේ පළල | - | මීටර් 3.00 |

*මාර්ගයේ දකුණු පස*


1. සී. එච්. මොළගොඩ යන අයට අයත් කහටකුඹුර ඉඩම.

*මාර්ගයේ වම්පස*

1. ඊ. එම්. අයි. ඒකනායක යන අයට අයත් කහටකුඹුර ඉඩම
2. ජේ. එම්. එස්. කේ. මැණිකේ යන අයට අයත් කහටකුඹුර ඉඩම
3. ජේ. එම්. එන්. ජයවීර යන අයට අයත් කහටකුඹුර ඉඩම
4. ජේ. එම්. බී. එස්. බණ්ඩාර යන අයට අයත් කහටකුඹුර ඉඩම
5. එම්. පී. එම්. කරුණාරත්න යන අයට අයත් කහටකුඹුර ඉඩම.

C.S.Liyanage(M.S.I.)
Registered Licensed Surveyor
No.40, Isuru Pedesa
Malkaduwawa
Kurunegala
Reg.No. 19700573

Plan No. 2020/101W




සත්‍ය පිටපතකි

Reference

B : Bank
St : Stake
S : Stream
TF : Threshing Floor
Road(RDA) : Road (Road Development Authority)

Containing in Extent

| Lot No. | Hectares | A | R | P | Remarks |
|---|---|---|---|---|---|
| 1 | 0.0555 | 0 | 0 | 21.95 | Proposed Means of Access(3.0 m Wide) |

(183.75 m Length)

Scale 1:1000

# PLAN

of

an allotment of land called "KAHATAKUMBURA" situated at Kalugalla village in G.N.Division of No.12 Kalugalla in D.S. of Kegalle in Kinigoda Korale of Deyaladahamuna pattu in the Disrict of

KEGALLE
SABARAGAMUWA PROVINCE

Bounded as described above Boundaries were surveyed as pointed out by Allottees
Survey was carried out on the request made by Allottees
Surveyed on 02-09-2020

C.S. LIYANAGE. (MSI)
Reg. Licensed Surveyor
Court Commissioner & Valuer.
Reg. No. 19700573

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | - | අඹන්පිටිය පාරෙන් හැරී යන සෙත් මාවත |
| 02. | වසම | - | 52 C පරනගම්පල |
| 03. | මාර්ගයේ දිග | - | මීටර් 56 |
| 04. | මාර්ගයේ පළල | - | මීටර් 2.43 (අඩි 08) |

*මාර්ගයේ දකුණුපස*


1. යූ. ජී. කේ. උඩුගම යන අයට අයත් ඉඩම
2. යූ. ජී. කේ. උඩුගම යන අය පදිංචි ඉඩම

*මාර්ගයේ වම්පස*

1. ගාමිණී පොත්තපිටිය යන අයට අයත් ඉඩම
2. එච්. ආර්. සී. කුමාරතුංග යන අයට අයත් ඉඩම
3. එම්. ඒ. ආර්. යූ. කේ. තිලකරත්න යන අයට අයත් ඉඩම

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තලමිතිකරු
7/7, උසාවිය පාර
කෑගල්ල.
ලි.ප. අංකය 19891716
දු.අංකය 0718142729

පිඹුරු අංකය 809




පරිමාණය 1: 1000

විස්තරය

| | |
|---|---|
| ක | කායිම් කණුව |
| පැවැ | පැළඉණි වැට |
| අවි | අවිනිශ්චිත |
| ආතා | ආධාරක තාප්පය |
| මාර්ග(ප්‍රාස) | මාර්ගය(ප්‍රාදේශීය සභා) |

## සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

අංක 52 C පරනගම්පල ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ පරනගම්පල ගමේ පිහිටි "සෙත් මාවත" නමැති

මාර්ගය මැන දැක්වෙන

## පිඹුර

සත්‍ය පිටපතකි

........................
සංවේදී කුශාන්ති,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

කැබැලි අංක 1 - මධ්‍ය රේඛාවේ දිග - මීටර 56.0, පළල මීටර 2.43 (අඩි 8), බිම් ප්‍රමාණය හෙක්ටාර 0.0138 (අ.0 , රූ.0, පර. 05.5)

සම්පූර්ණ බිම් ප්‍රමාණය අ 0, රූ 0, පර. 05.5 (හෙක්ටාර 0.0138)

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තලමිතිකරු
2021.01.30

මැනීම කළේ 2021.01.28

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

## නුවරඑළිය මහා නගර සභාව

නුවරඑළිය මහා නගර සභාව විසින් 2021 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2020.12.24 දිනැතිව පළවූ IV (ආ) කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සඳහන් පහත පරිදි කාරණා පිළිබඳ සිදු කරනු ලබන සංශෝධනයයි.

2021 වර්ය සඳහා පහත සඳහන් ගාස්තු අය කිරීමට 2020.11.27 දින 04 iii-169 අංක දරන තීරණය මගින් තීරණය කර ඇත.

01. වික්ටෝරියා ශ්‍රවනාගාරය (පුස්තකාල ශ්‍රවනාගාරය)

| *ලබාදෙන පදනම (එක් දිනකට)* | *මුදල (රු . ශත)* |
|---|---|
| මුදල් ගෙවා | රු. 5,000 + රජයේ අනුමත බදු මුදල් |

*නුවරඑළිය මහා නගර සභාව*

2021 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අය කිරීමට 2020.11.27 දින 04-iii-169 අංක හා 2021.03.05 දින 04-iii-138 අංක දරන තීරණ මගින් තීරණය කර ඇත.

10. **I** *ජල සේවා සඳහා ගාස්තු*

- ලීටර් 8000 ජල බවුසරය සඳහා රු. 8,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 6000 ජල බවුසරය සඳහා රු. 6,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 4000 ජල බවුසරය සඳහා රු. 4,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 2000 ජල බවුසරය සඳහා රු. 2,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 8000 ජලය පමණක් ලබා දීම සඳහා රු. 4,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 6000 ජලය පමණක් ලබා දීම සඳහා රු. 3,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 4000 ජලය පමණක් ලබා දීම සඳහා රු. 2,000.00 + රජයේ බදු මුදල්
- ලීටර් 2000 ජලය පමණක් ලබා දීම සඳහා රු. 1,000.00 + රජයේ බදු මුදල්

නගර සීමාවෙන් පිටත ප්‍රවාහනය සඳහා (යාමට ඒමට) 1 කි. මී. සඳහා රු. 35.00 මුදලක් අය කරනු ලැබේ.

- ජලය ලබා ගැනීම සඳහා අයදුම්පතක් රු. 600 + රජයේ බදු මුදල්
- ස්ථානීය පරීක්ෂාව සඳහා රු. 200 + රජයේ බදු මුදල්
- ජල සාම්පල් පරීක්ෂාව සඳහා රු. 1,200 + රජයේ බදු මුදල්

**II.** **ජල බිල්පත් සඳහා ගාස්තු**

**ගෘහ A /රජයේ නිල නිවාස**

ඒකක සඳහා ගාස්තු + ස්ථාවර ගාස්තුව රු. 50.00 + රජයේ බදු මුදල්

| මාසික පාරිභෝගික ඒකක | එක් ඒකකයක් සඳහා ගාස්තුව රු. |
|---|---|
| 01-05 දක්වා | 3.00 |
| 06-20 දක්වා | 10.00 |
| 21-30 දක්වා | 25.00 |
| 31-40 දක්වා | 35.00 |
| 41-50 දක්වා | 45.00 |
| 51 ට වැඩි | 65.00 |

ගෘහ **B**

ඒකක සඳහා ගාස්තු + ස්ථාවර ගාස්තුව රු. 50.00 + රජයේ බදු මුදල්

| මාසික පාරිභෝගික ඒකක | එක් ඒකකයක් සඳහා ගාස්තුව රු. |
|---|---|
| ඒකක 1 සිට 40 දක්වා | 20.00 |
| ඒකක 41 සිට 50 දක්වා | 45.00 |
| ඒකක 51 න් පසුව | 65.00 |

*ආයතන*

| *ආයතන* | *ගාස්තුව* |
|---|---|
| වාණිජ ආයතන/කාර්මික ආයතන හා ඉදි කිරීම්/ආයෝජන මණ්ඩල හා අනුමත කර්මාන්ත ශාලා/සංචාරක හෝටල්/පෞද්ගලික පාසල්/රජයේ ආයතන/රෝහල් | පළමු ඒකකයේ සිට එක් ඒකකයක් සඳහා රු. 52.00 + ස්ථාවර ගාස්තුව රු. 80.00 + රජයේ බදු මුදල් |
| රජයේ පාසල් (ළමුන් 100ක් සඳහා) මසකට (ගුරු නිල නිවාස සඳහා මෙම අය කිරීම අදාළ නොවේ.) | පළමු ඒකකයේ සිට එක් ඒකකයක් සඳහා රු. 15.00 + ස්ථාර ගාස්තුව රු. 60.00+ රජයේ බදු මුදල් |
| ආගමික ස්ථාන | ස්ථාවර ගාස්තු රු. 60.00 + ගෘහ A යටතේ බිල්ගත වන මුළු බිල්පතෙන් 40%ක් පමණක් |
| පොදු ජල කරාම | පළමු ඒකකයේ එක් ඒකකයක් සඳහා සිට රු. 3.00 + ස්ථාවර ගාස්තුව රු. 60.00+ රජයේ බදු මුදල් |
| විදුලි පොම්ප යොදවා ජලය ලබාදෙන ස්ථාන (හැඩන්හිල්, යුනික්වීව්, බොනවිස්ටා, කළාපුර, ගැමුණුපුර, නේස්බි, හාවාඑළිය ලෝ ඒරියා) | බිලට අමතරව 20% ක් අය කෙරේ. |
| තොග සම්බන්ධතා (Bulk Connection) සඳහා | 3/4" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,000.00+ රජයේ බදු මුදල්<br>1" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,250.00+ රජයේ බදු මුදල්<br>2" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,500.00+ රජයේ බදු මුදල්<br>3" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,750.00+ රජයේ බදු මුදල්<br>4" සඳහා ස්ථාවර ගාස්තුව රු. 2,000.00+ රජයේ බදු මුදල් |

**III.** වෙනත් අය කිරීම්

| | රු. ශත |
|---|---|
| • ඇප තැන්පත් ගෘහස්ථාන | 750.00 |
| • ඇප තැන්පත් ගෘහ නොවන වානිජ | 1,500.00 |
| • ඇප තැන්පත් තාවකාලික ජල සම්පාදන | 7,500.00 |
| • නැවත සන්ධි කිරීමේ ගාස්තු | 750.00 |
| • පාරිභෝගික ඉල්ලීම මත විසන්ධි කර නැවත සන්ධි කිරීමේ ගාස්තු | 500.00 |
| • පාරිභෝගික ඉල්ලීම මත ජල මීටරය පරීක්ෂා කිරීමට කටයුතු කිරීමේ දී අදාළ මීටරයේ දෝෂයක් නොමැති බවට තහවුරු වූ විට අය කරන ගාස්තුව | 500.00 |

**IV.** අනවසර ජල ගාස්තු

- අනවසර ජලය ලබා ගන්නා අවස්ථාවක දඩ මුදල

  රු. 7,500.00

- අනවසරයෙන් ජලය පරිහරණය කරනු ලබන බවට හෙළි වූ දිනට පෙර හෝ විසන්ධි කරන ලද දිනට පෙර මාස 12 ක් ඇතුළත මාස වල මනුගතව තිබූ උපරිම සංඛ්‍යාව මෙන් දසගුණයක් වූ ඒකක සංඛ්‍යාවක් අනවසරයෙන් ජලය පාවිච්චි කර ඇති මාස ගණනින් වැඩි කර සේවා ගාස්තුවක් දඩ ගාස්තුවක් ලෙසද, ඊට අමතරව රු. 2,500.00 ක් වූ අතිරේක ගාස්තුවක් ද අය කරනු ලබන අතර, නැවත සම්බන්ධ කිරීමේ දී නැවත සන්ධි කිරීමේ ගාස්තුවක් ද අය කරනු ලැබේ. (අදාළ ස්ථානයේ ජල මීටරයක් නොමැති අවස්ථාවක නාගරික ඉංජිනේරු හෝ ජල අධිකාරි විසින් තීරණය කරන පරිදි අය කළ යුතුය.) නගර සභාව විසින් බෙදා දෙනු ලබන ජලය අනවසර ලෙස භාවිතා කරනු ලැබුවහොත් ඉහත දඩ ගාස්තු අය කරනු ලැබේ.

**V.** ජලය ලබා දිය හැකි බවට නිරාකරණ සහතිකයක් ලබා ගැනීම

| | |
|---|---|
| • විශාල පරිමාණයේ ගොඩනැගිලි සඳහා | රු. 15,000 + රජයේ අනුමත බදු |
| • වානිජ සඳහා | රු. 1,000 + රජයේ අනුමත බදු |
| • ගෘහ හා වෙනත් සඳහා | ගාස්තු අය නොකෙරේ. |

*නුවරඑළිය මහා නගර සභාව*

2021 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අය කිරීමට 2020.11.27 වැනි දින 04-iii-169 අංක දරන තීරණය මගින් තීරණය කර ඇත.

12. ගලී බවුසර්

| | |
|---|---|
| • ලොකු ගලී බවුසරය - නගර සීමාව තුළ - ගෘහ සේවා | රු. 3,000.00 + රජයේ අනුමත බදු මුදල් |
| - වාණිජ සේවා | රු. 5,000.00 + රජයේ අනුමත බදු මුදල් |
| • කුඩා ගලී බවුසරය - නගර සීමාව තුළ - ගෘහ සේවා | රු. 1,500.00 + රජයේ අනුමත බදු මුදල් |

- නගරයට ආසන්නම ස්ථානය අත්‍යාවශ්‍ය අවස්ථාවක් සඳහා කුඩා ගලි බවුසරය සැපයීම -

  සේවා ගාස්තු රු. 3,000.00 + තැන්පත් මුදල රු. 3,000.00 + ප්‍රවාහන ගාස්තු (කි. මී. එකකට රු. 100.00 බැගින්) + රජයේ අනුමත බදු මුදල්

- ලොකු ගලී බවුසරය - නගර සීමාවෙන් පිටත -

සේවා ගාස්තුව (බවුසර් ලෝඩ් එකකට) රු. 7,500.00 + තැන්පත් මුදල් රු. 5,000.00 + ප්‍රවාහන ගාස්තු (කි. මී. එකකට රු. 100.00 බැගින්) + යැපීම් දීමනා රු. 1,400.00 + අපද්‍රව්‍ය ගෙන ඒමේ ගාස්තු රු. 1,000.00 + රජයේ අනුමත බදු මුදල්

13. සෞඛ්‍ය සේවා හා අවමංගල්‍ය කටයුතු

- සුසාන භූමියේ ස්මාරකයක් ඉදි කිරීමට (වර්ග අඩි එකක් සඳහා) රු. 50,000 + රජයේ බදු මුදල්
- නගර සීමාවෙන් පිටත ආදාහනාගාර ගාස්තු රු. 10,000
- නගර සීමාව තුළ ආදහනාගාර රු. 5,000
- වැඩිහිටි භූමදන ගාස්තු - නගර සීමාව තුළ රු. 200
- ළමා භූමදාන ගාස්තු - නගර සීමාව තුළ රු.100
- වැඩිහිටි භූමදන ගාස්තු - නගර සීමාවෙන් පිටත රු. 500
- ළමා භූමදන ගාස්තු නගර සීමාවෙන් පිටත රු. 300

17. පරිසර බලපත්‍ර නිකුත් කිරීම - පරීක්ෂා කිරීමේ ගාස්තු

ව්‍යාපාරයේ තක්සේරු වටිනාකම

| | |
|---|---|
| 2,50,000.00 හෝ ඊට අඩු | රු. 3,000.00 |
| 2,50,001 සිට 5,00,000.00 | රු. 3,750.00 |
| 5,00,001.00 සිට 1,000,000.00 | රු. 5,000.00 |
| 1,00,000.00 ට වැඩි | රු. 10,000.00 |
| බලපත්‍ර ගාස්තු | රු. 4,000.00 + රජයේ බදු මුදල් |

එස්. පී. කේ. බෝධිමාන්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - නුවරඑළිය.

08-197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.